**මහියංගණ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 18 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 31 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මහියංගණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවස්ථා දෙකක දී සාවද්‍ය ලෙස ණයහිමියන් සඳහා රු. 1,151,692 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ උල්හිටිය පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ණයගැතියන් රු. 200,000 ක් අඩුවෙන් ප්‍රතිපාදන කර තිබුණි.

(ඇ) ඉදිරි වර්ෂය වෙනුවෙන් දරන ලද රු.75,369 ක වියදම ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගත් රු.53,900 ක විවිධ කාර්යාල උපකරණ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල සමීක්ෂණයෙන් අනාවරණය වූ පොත් ඌනතාවයන්ගේ වටිනාකමවූ රු.32,340 ක් මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත්කර නොතිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**
---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් හිඟ ආදායම් ශේෂය රු.12,523,050 ක් වුවත්, ලේඛන අනුව ශේෂය රු.12,227,148 ක් ලෙස පැවතුනි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකාමර බදුහිමියන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය කඩකුලී ලේඛනය අනුව රු. 26,300 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල එය රු.12,600 ක් ලෙස පැවතුනි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 22,275,720 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.30,938,256 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 9,819,882 ක වත්කම් විෂයන් 04 ක්, විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-------------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය පනත | |
| | (i) 132(ඕ) වගන්තිය | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන් වෙත 2016 වර්ෂයේ රු.63,690 ක් වටිනා ආධාර ලබාදී තිබුණි. |
| | (ii) 158 හා 159 වගන්ති | සියලු ආදායම් ලේකම් වරයා විසින් අයකර සභා අරමුදලට බැරකළ යුතු වුවත් රු.438,875 ක හිඟ කඩකුලී හා රු.2,550,307 ක වරිපනම් බදු අයකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2016 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත්වූ රු.43,466 ක තැන්පත් ශේෂ 2 ක් නියාදනය කර නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| | (i) රීති 5(7) | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් කර නොතිබුණි. |
| | (ii) 180 වන රීතිය | නිලධාරීන් දෙදෙනෙකු විසින් රු.15,000 ක ඇප තැන්පත් කර නොතිබුණි. |
| | (iii) 218 වන රීතිය | 2016 වර්ෂයට අදාළව ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4:6 වගන්තිය | ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැර ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු.46,511 ක සේවක ණය අයකරගෙන නොතිබුණි. |
| (ඉ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ 16 වැනි ඡේදය හා 1982 අංක 03 දරන පනතේ (සංශෝධිත) 27 වැනි ඡේදය | සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක මුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් 2015 වර්ෂයේදී රු.39,333 ක අධිභාරයක් ගෙවා තිබුණි. |
| (ඊ) | 1985 අංක 1 දරන පනතින් සංශෝධිත 1958 | 2002-2014 වර්ෂය දක්වා සේවක අර්ථසාධක |

| | |
|---|---|
| අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වන වගන්තිය | (සංශෝධන) අරමුදලට රු.68,436 ක අධිභාර ගෙවිය යුතුව තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,479,131 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 13,292,071 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

(අ) 2016 ජනවාරි 01 දිනට පැවැති මුළු හිඟයෙන් වර්ෂය තුළ අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 57 ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු හිඟය රු. 1,483,847 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට බිල්කිරීම් වලින් වර්ෂය තුළ අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 65 ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු හිඟය රු. 1,066,459 ක් විය.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 සහ 159 වගන්ති අනුව වෙළඳ සංකීර්ණයකින් ව්‍යාපාර 17 ක වෙළෙඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 6,000,791 ක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

ප්‍රාදේශීය සභාව සතු පිරිවැය රු.138,650 ක් වූ ත්‍රීවිල් රථයක් 2016 අගෝස්තු 31 දිනෙන් පසුව නිෂ්ක්‍රියව කාර්යාල භූමියෙහි ගාල්කර තිබුණි.

### 3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

(අ) 2013 වර්ෂයේ දී පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා රු. 13,647,008 ක් වැයකර තිබූ නමුත් ව්‍යාපෘතියේ අරමුණුගත කාර්යයන් ඉටුකර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ආ) 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ II කොටස 10(i) (ආ) (උ) අනුව පරිසරයට හානිවන ද්‍රව්‍ය හා ඝන අපද්‍රව්‍ය ප්‍රමාණවත් පාලනයකින් යුක්තව බැහැර කළයුතු වුවත්, බදුල්ල, මහියංගණය ප්‍රධාන මාර්ගයේ මීටර් 250 ක පමණ දුරින් වූ අක්කර 5 ක පමණ ඉඩමකට අක්‍රමවත්ව කසල බැහැර කරමින් තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**
-----------------------------------------

4.1 **අයවැය පාලනය**
-----------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**
--------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**
------------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලනය**
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) කර්මාන්ත පාලනය
(ආ) ගබඩා පාලනය
(ඇ) ආදායම් පාලනය